

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

2020

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

தேசிய விஞ்ஞான மற்றும் தொழில்நுட்ப ஆணைக்குழு

National Science and Technology Commission

NASTEC

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව - **2020**

ස්තුතිය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත පහසුකම් සලසමින් මූල්‍ය සහාය ලබාදීම වෙනුවෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත කළමනාකාරිත්වයේ ස්තුතිය හිමිවේ. කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීම උදෙසා ලබාදුන් සහයෝගය හා අනුබලය කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජිකයන් විසින් අගය කොට සලකනු ලබයි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජය වෙත විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමේ හා උපදෙස් ලබාදීමේ ප්‍රමුඛතම ආයතනය ලෙස නම් කොට ඇත. කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.



පරිශ්‍රයේ ලිපිනය

6වන මහල, D කොටස, 'සෙත්සිරිපාය' II වන අදියර, බත්තරමුල්ල.

ඇමතුම් කොරතුරු



011- 2186711



011- 2186713



info@nastec.gov.lk



www.nastec.gov.lk



ලංකා බැංකුව, හයිඩ් පාක්



විගණකාධිපති දෙපාර්තමේන්තුව

පටුන

ස්තුතිය 2

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව 3

රූප සටහන් වගුව 5

1994 අංක 11දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් පනවන ලද කාර්යයන් 6

අපගේ මෙහෙවර 6

අපගේ දැක්ම 6

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ 8

ආයතනික ව්‍යුහය 9

සභාපතිනියගේ සමාලෝචනය 10

කොමිෂන් සභාවේ සාමාජිකයන් 13

මහා භාණ්ඩාගාර නියෝජිතයන් 14

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2020 15

කාර්ය සාධනය පිළිබඳ උද්දීපනයන් 2020 - 16

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යය (1): විද්‍යාව හා තාක්ෂණය ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම *16*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්යය :(2) ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්ෂිකව රජයට වාර්තාවක් ඉදිරිපත් කිරීම *19*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය *20*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යය (4): අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්ට සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට පෙර ඒවාහි අදහස් ලබාගැනීම *26*

තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ විධායක කමිටුව 2020 27

ජාත්‍යන්තර කටයුතු 31

නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre) *31*

මානව සම්පත් කළමනාකරණය 33

කාර්ය මණ්ඩල පුවත් 33

ධාරිතා සංවර්ධන / ගෘහස්ත හා බාහිර පුහුණු වැඩසටහන් 34

සුභසාධන කටයුතු 34

විදේශ පුහුණුසම්භාෂණ සඳහා සහභාගිත්වය /සම්මන්ත්‍රණ /වැඩමුළු / 34

මූල්‍ය ප්‍රකාශනය 35

විගණකාධිපති වාර්තාව 39

රූප සටහන් වගුව

රූප සටහන 1:පනත හා නීති, දැක්ම හා මෙහෙවර 6

රූප සටහන 2: සංවිධාන ව්‍යුහය 9

රූප සටහන 3: විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතන ව්‍යාපෘතියේ බාහිර පාර්ශවකරුවන්ගේ රැස්වීම 18

රූප සටහන 4: විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2018 19

රූප සටහන 5 : ශාක ආරක්ෂණ සේවයේ හා බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ කාර්යක්ෂමතා සමාලෝචන වාර්තා 21

රූප සටහන 6 : ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන (NERDC) කාර්ය සාධන සමාලෝචනය 22

රූප සටහන 7 : ජාතික විද්‍යා පදනමේ කාර්ය සාධන සමාලෝචනය 23

රූප සටහන 8 : ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) කාර්ය සාධන සමාලෝචනය 24

රූප සටහන 9 : ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) කාර්ය සාධන සමාලෝචනය 24

රූප සටහන 10 : කාර්මික තාක්ෂණ ආයතනය (ITI) කාර්ය සාධන සමාලෝචනය 25

රූප සටහන 11 : රබර් පර්යේෂණායතනයේ (RRI) කාර්ය සාධන සමාලෝචනය 26

රූප සටහන 12 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ විධායක කමිටු රැස්වීම 28

රූප සටහන 13 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ 09වන මාර්ගගත සමුළුව 29

රූප සටහන 14 : පර්යේෂණ සඳහා වූ සංඛ්‍යාන පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව 30

රූප සටහන 15 : මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 36

රූප සටහන 16 : මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය 38

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් පනවන ලද කාර්යයන්

පනත හා නීති

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලද අතර, 1998 අගොස්තු මාසයේ සිට ක්‍රියාත්මක වේ. 1998 දෙසැම්බර් මස 06 වන දින විධිමත් පරිදි අරඹන ලද එය 1999 ජනවාරි මාසයේදී සක්‍රීය කොමිෂන් සභාවක් බවට පත්විය.

දැක්ම

අපගේ දැක්ම

"ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත හා සමෘද්ධිය නංවාලනු පිණිස වූ විභවතාව හා ඒ සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සඳහා රජයට උපදෙස් ලබාදෙන අති විශිෂ්ට උපදේශනායතනයක් බවට පත්වීම."

මෙහෙවර

අපගේ මෙහෙවර

"තිරසර සංවර්ධනය උදෙසා යොදාගනු පිණිස විද්‍යා හා තාක්ෂණ අංශයන්ගේ උසස් ජාතික හැකියාවන් ගොඩනැගීම උදෙසා රජය වෙත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය"

රූප සටහන 1: පනත හා නීති, දැක්ම හා මෙහෙවර

- පහත සඳහන් ක්ෂේත්‍රයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම්ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම:

  - ආර්ථික අභිවෘද්ධිය උත්තේජනය කරනු පිණිස විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
  - කර්මාන්ත, කෘෂිකර්ම, සේවා හා ආර්ථික ක්ෂේත්‍රයනට අදාළ කාර්යක්ෂමතාවය හා තරගකාරිත්වය සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ බලපෑම;
  - ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනු පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දුගීබව දුරැලීම යන ක්ෂේත්‍රයන් මත විද්‍යාවේ හා තාක්ෂණයේ බලපෑම;
  - අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතුවන බලධාරීන්ගේ උපදේශනය සමග විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය මානව හා සෙසු සම්පත් සංවර්ධනය;
  - ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
  - ජාතික වැදගත්කමකින් යුතු විය හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය;
  - විද්‍යා හා තාක්ෂණ ප්‍රවීණත්වය ගොඩනැගීම, පවත්වා ගැනීම හා ආකර්ශනය සඳහා තුඩු දෙන පරිසරයක් නිර්මාණය කිරීම;
  - විද්‍යාව හා තාක්ෂණය ඵලදායක ලෙස යෙදාගැනීම සඳහා තුඩුදෙන කළමනාකරණ ක්‍රමෝපායන් ස්ථාපනය;
  - විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල්කරණය සඳහා ප්‍රමුඛත්වය ලබාදීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම.

- පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ රජයේ වියදම්හි ඵලදායකත්වය හා රාජ්‍ය අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම;

- විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණික ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය;

- විද්‍යා හා තාක්ෂණික ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ එවන් ආයතනයන්හි අදහස් විමසීම;

- අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවා පනතේ 2වන කොටස තුළ දක්වා ඇති අරමුණු හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සංසදයක් ඇති කිරීම ; හා එම සාකච්ඡාවන් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ

- *සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.*
- *අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ.*
- *ආංශික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සැලසුම් හා විද්‍යා හා තාක්ෂණ අංශයට සම්බන්ධ අනෙකුත් ලේඛන සම්පාදනය පිණිස ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් හා විද්‍යාඥයන් බාහිර පාර්ශවකරුවන් හා උපදේශක සංසද සමග කටයුතු කරති.*
- *පනත මගින් බලය ලබාදී ඇති පරිදි විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ආයතනික සමාලෝචන කාර්යයන් සිදුකරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් පෙළ ගස්වනු ලබයි.*

ආයතනික ව්‍යුහය



රූප සටහන 2: සංවිධාන ව්‍යුහය

සභාපතිනියගේ සමාලෝචනය



ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිනිය වශයෙන් 2020 වසර සඳහා වූ එම කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳ ඉමහත් සතුටට පත්වෙමි.

2020 ජනවාරි මස 16වන දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරිය ලෙස රාජකාරී ආරම්භ කළ නමුදු මාර්තු මස 20වන දින සිට කොවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල හේතුවෙන් රට අගුලු දමා තිබිණි. රට අගුලු දමා තිබූ සමය තුළ පවා ආයතනයේ කටයුතු මනාසේ සිදුවන බවට වගබලාගනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු මාර්ගගතව සිදු කෙරිණි. කොමිෂන් සභා රැස්වීම් දහයක් පවත්වන ලද අතර ඉන් 5ක් Zoom වේදිකාව මත සිදු කෙරිණි.

පොදුවේ රටක සංවර්ධනය එහි විද්‍යාව හා තාක්ෂණයේ වර්ධනය සමගින් දැඩිසේ සම්බන්ධ වේ. එබැවින් බොහෝ රටවල කෘෂිකර්මය, සෞඛ්‍ය හා සාමාන්‍ය පුරවැසියන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා විද්‍යා ප්‍රතිපත්තියට හා එය ක්‍රියාත්මක කිරීමට ඉහළම ප්‍රමුඛත්වයක් ලබාදෙනු ලබයි. ආර්ථික න්‍යාය පත්‍රය තුළ ඉහළම ප්‍රමුඛත්වය ලබා දෙමින් මේවන විට තාක්ෂණ අමාත්‍යාංශය අතිගරු ජනාධිපතිතුමන් යටතේ ක්‍රියාත්මක වීම සුභවාදී තත්ත්වයකි. කොවිඩ් 19ද සමගින් ඉස්මතුවූ වර්තමාන වසංගත තත්ත්වය විසින් වඩාත් නිශ්චිතව ක්ෂුද්‍ර ජීව විද්‍යාඥයන්, වෛරසවේදීන්, වසංගතවේදීන් හෝ ගණිතඥයන් ආදී එන විද්‍යාඥයන්ගේ වැදගත්කම ඉස්මතු කර ඇත.

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත (1994 විද්‍යා හා තාක්ෂණ පනත) යටතේ පවරා දී ඇති බලතල ප්‍රකාර, විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා වූ ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම, පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජය වෙත වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය හා ද්වි-වාර්ෂිකව ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත බලය පවරා දී ඇත. මෙයට අමතරව විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත පවරනු ලබන සෙසු අදාළ කටයුතු සිදු කිරීමද ඇතුළත් වේ.

2020 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන විද්‍යා හා තාක්ෂණ ආයතන 07හි කාර්යක්ෂමතා සමාලෝචනයක් ආරම්භ කරන ලදී: ජාතික විද්‍යා පදනම, කාර්මික පුහුණු ආයතනය, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණායතනය, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරිය, පළිබෝධ නාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය හා රබර් පර්යේෂණ ආයතනය වශයෙනි. මෙය කොවිඩ් තත්ත්වය මධ්‍යයේ සිදු කරන ලදී. කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් සමන්විත විශේෂ කමිටුවක් විසින් මෙම සමාලෝචන ක්‍රියාවලිය සඳහා ප්‍රවීණයන් තෝරා ගන්නා ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුව සෞඛ්‍ය මාර්ගෝපදේශයනට අනුගත වෙමින් බාහිර පාර්ශවකරුවන් හා සෙසු අදාළ පාර්ශ්වකරුවන්ද සමගින් මාර්ගගතව මෙහෙයවන ලද සාකච්ඡා පවත්වමින් විශේෂඥ මණ්ඩල හා ආයතන විසින් ලබාදෙන ලද සහාය ද මේ අවස්ථාවේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සිහිපත් කරනු ලබයි.

කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) හා හවුල්කාරිව ඒකාබද්ධ නිල සංවර්ධන සහයෝගිතා (ODA) ව්‍යාපෘතිය නොකඩවා ඉදිරියට ගෙනයාම් වශයෙන් නිර්ණායක 3ක්

සහිත කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සඳහා මාර්ග සිතියමක් ගොඩනැගීමේ කාර්යය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී: 1) ගුණාත්මක මහා පරිමාණ නිෂ්පාදන සඳහා නව තාක්ෂණය සහිත කෘෂිකර්මය, නිෂ්පාදන ප්‍රවර්ධනය 2) කෘෂි නිෂ්පාදන අගය එක් කිරීම, ආහාර තාක්ෂණය - ක්‍රියාවලි ප්‍රවර්ධනය 3) ග්‍රාමීය අංශය විසින් සිදුකරන සුළු, මධ්‍ය කෘෂි ව්‍යාපාර ව්‍යවසායකත්වය හා කෘෂිකාර්මික නිෂ්පාදන හා අලෙවිකරණ සඳහා වූ යෙදවුම් (Apps) - ව්‍යවසාය ප්‍රවර්ධනය වශයෙනි.

ජාතික ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව හා පශ්චාත් කොවිඩ් බලපෑම ආමන්ත්‍රණය කරනු පිණිස, තේමාත්මක මූලාරම්භයන් තුනක් යටතේ ප්‍රමුඛතාගත ක්ෂේත්‍රය ලෙස කෘෂිකාර්මික අංශය හඳුනාගෙන ඇත. මෙම පද්ධති අධ්‍යයනය සිදු කිරීම මගින් රටේ ආහාර සමානාත්මතාවය හා ආරක්ෂාව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කෘෂි ව්‍යාපාර හා ව්‍යවසායකත්වය හා නවීන හා උසස් තාක්ෂණයන් උපයෝගයෙන් කෘෂි නිෂ්පාදන සඳහා වූ අගය එක් කිරීම් ආමන්ත්‍රණය කරන්නාවූ, එම අංශය සඳහා වූ ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරී සැලැස්මක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. එකඟතාවය වූයේ ක්‍රියාත්මක කිරීමේ හා ස්ථාපනය කිරීමේ මට්ටම දක්වා අවශ්‍ය විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය හඳුනාගනු පිණිස බිම් මට්ටමේ ප්‍රජාව සමගින් කටයුතු කිරීම සඳහා වූ නියමු ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමයි.

නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකාවේ ජාතික කේන්ද්‍රස්ථානය වන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව නොබැඳි ජාතීන්ගේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre) මගින් ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් හා විද්‍යා පරිපාලකවරුන් සඳහා පුහුණු අවස්ථා කිහිපයක් ලබාදීමටද සම්බන්ධ විය.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 නොවැම්බර් 13 වන දින තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ (YSF) 9 වැනි සම්මන්ත්‍රණය ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පද්මා රාජපක්ෂ මහත්මිය විසින් තරුණ විද්‍යාඥයන් ආමන්ත්‍රණය කරන ලදී. කොමිෂන් සභා සාමාජිකයෙකු වන ආචාර්ය රවි ලියනගේ විසින් තරුණ විද්‍යාඥයන් හා ව්‍යවසායකයන් සතු කාර්ය භාරය පිළිබඳ ප්‍රධාන දේශනය සිදු කරන ලදී. මහාචාර්ය මෛත්තිකා විතානගේ මහත්මිය විසින් එතුමියගේ පර්යේෂණ වැඩසටහන පිළිබඳව ඉදිරිපත් කරන ලදී. Zoom වේදිකාව මත සමාන්තරව සැසි 4ක් තුළ පර්යේෂණ පත්‍රිකා 51ක් ඉදිරිපත් කරන ලදී. මෙය වූකලි එදා මෙදාතුර ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් zoom වේදිකාවක් මත පවත්වන ලද පළමු සමුළුව විය. වැඩබලන අධ්‍යක්ෂවරයාගේ මහ පෙන්වීම යටතේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ සභාපති ආචාර්ය කේ.ඩබ්.එල්.කේ. වීරසිංහ, සම ලේකම්වරුන් වන ආචාර්ය එම්.කේ. මීගහකුඹුර හා ආචාර්ය යූ.එස්. ලියනාරච්චි යන මහත්වරුන් සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විද්‍යාඥ තිළිණි මුණගමගේ මහත්මිය විසින්ද කැපවීමෙන් ඉටු කරන ලද කාර්ය භාරය එහි සාර්ථකත්වයට දායක විය.

2017 සිට, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවෙහි ප්‍රගතියට බාධා වන පරිදි පැවති අභ්‍යන්තර ගැටලුවේදී එයට බාධා වන අයුරින් රජයේ අරමුදල් අහිමි කරමින් පූර්ණ වැටුප් සහිතව අනිවාර්ය නිවාඩු මත සිටි අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් අවසන් පරීක්ෂණය සිදු කිරීමට හැකිවිය. මේවන විට අවසන් පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ගරු තිලංග සුමතිපාල මැතිතුමා, එහි වත්මන් රාජ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) සීතා අබේපොල මහත්මිය, ලේකම්වරුන් වන අනුර දිසානායක මහතා හා පද්මා රාජපක්ෂ මහත්මිය හා අමාත්‍යාංශයේ සෙසු නිලධාරීන් විසින්ද ලබාදුන් සක්‍රීය සහයෝගය කෘතවේදීව සිහිපත් කරමි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ඉදිරියට ගෙනයාම පිණිස ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන් වෙත ස්තුතිය පළ කරමි. ලබාදුන් විශ්වසනීය සහයෝගය වෙනුවෙන් වැඩබලන අධ්‍යක්ෂිකා නසීමා අහමඩ් මහත්මිය හා ඵලදායී ලෙස කණ්ඩායම් හැඟීමෙන් සිදුකළ සේවය වෙනුවෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ද කෘතවේදීව සිහිපත් කරමි.

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපති
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
2020 ජනවාරි 16 සිට 2020 දෙසැම්බර් 31 දක්වා

කොමිෂන් සභාවේ සාමාජිකයන්



මහාචාර්ය නිරන්ජනී රත්නායක
මහත්මිය, කොමිෂන් සභා සාමාජික

ඉංජිනේරු මහාචාර්ය
නිරන්ජනී රත්නායක මහත්මිය
මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල්
ඉංජිනේරු විෂය පිළිබඳ සම්මානිත
මහාචාර්යවරියකි



මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු
මහත්මිය, කොමිෂන් සභා සාමාජික

මහාචාර්ය සිරිමලී ප්‍රනාන්දු මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියකි.



ආචාර්ය රවි ලියනගේ
මහතා, කොමිෂන් සභා සාමාජික

ආචාර්ය ලියනගේ යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආහාර, පුද්ගලික සත්කාර හා ගෘහභාණ්ඩ නිෂ්පාදන සමාගමක් වන රයිගම් ආයතනයේ
සමාරම්භක, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාද වේ.



මහාචාර්ය සුදත් රොහාන් මුණසිංහ
මහතා, කොමිෂන් සභා සාමාජික

වරලත් ඉංජිනේරුවරයෙකු වන මහාචාර්ය රොහාන් මුණසිංහ මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයට අනුයුක්තව සේවය කරයි.



මහාචාර්ය රේණුකා නිල්මිණි මහත්මිය, කොමිෂන් සභා සාමාජික

මහාචාර්ය ඒ.එච්.එල්.ආර් නිල්මිණි මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨාධිපතිනිය වේ.



රුවන් කුකුලේවිතාන මහතා, කොමිෂන් සභා සාමාජික

රුවන් කුකුලේවිතාන මහතා RH Steel Building Systems පුද්ගලික සමාගමේ සභාපති/ කළමනාකරණ අධ්‍යක්ෂ වේ.

මහා භාණ්ඩාගාර නියෝජිතයන්



ධර්ෂිණී ප්‍රසාන්ත් මහත්මිය, කොමිෂන් සභා සාමාජික

ධර්ෂිණී ප්‍රසාන්ත් මහත්මිය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය ලෙස කටයුතු කරයි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2020

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය	**සභාපති**
නසීමා අහමඩ් මහත්මිය	වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2020 ජුනි මස පළමුවැනිදා සිට)
ආචාර්ය තමාරා එෆ්. ඩයස් මහත්මිය	වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2020 ජනවාරි 27 සිට මැයි 31 දක්වා)
නන්දනී සමරවික්‍රම මහත්මිය	වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී (2020 ජනවාරි 26 දක්වා)
ආචාර්ය කල්ප ඩබ්. සමරකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ
සෙයිඩ් ශහම් මහතා	ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ
ජී.සී. කුමාරි පීරිස් මහත්මිය	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය හා පාලන
රසිතා පෙරේරා මහත්මිය	විද්‍යාඥ
එම්.ඩී. තිළිණි මිය	විද්‍යාඥ
යූ.කේ.ඩී.එල්.එච්.කේ. උඩුගම මිය	පරිපාලන නිලධාරී
එස්.ඒ.ඩී.එස්.පී. සේනානායක මහතා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/දත්ත පදනම් ආශ්‍රිත නිලධාරී
ආර්.එම්.ටී. රත්නායක මහතා	වැඩසටහන් සහකාර - මුදල්
ජී.එම්.සී.එන්. මහරගේ මහත්මිය	කළමනාකරණ සහකාර
ඩබ්.එම්.අයි.කේ. වෙදමුල්ල මහත්මිය	කළමනාකරණ සහකාර
අනිල් හෙට්ටිආරච්චි මහතා	රියැදුරු
ජයශාන්ත ප්‍රභාත් මහතා	රියැදුරු
ප්‍රදීප් එරන්ද මහතා	රියැදුරු
ඒ.ඩී. ධනපාල මහතා	කාර්යාල කාර්ය සහායක
කණිෂ්ක ගිම්හාන් මහතා	කාර්යාල කාර්ය සහායක (2020 මාර්තු 16 දක්වා)

කාර්ය සාධනය පිළිබඳ උද්දීපනයන් - 2020

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යය (1): විද්‍යාව හා තාක්ෂණය ගොඩනැඟීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම

01. ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය හා මහවැලි සංවර්ධන, පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයද සමග ඒකාබද්ධව ජාතික ඛනිජ සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී. අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස මෙම ප්‍රතිපත්තිය අනුමත කරන ලදී. කෙසේ වුවද, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු පිණිස සුදුසු ක්‍රමෝපායන් හා ක්‍රියාකාරී සැලසුම්ද සහිතව ප්‍රතිපත්තිය නැවත ඉදිරිපත් කරන ලෙස විෂය භාර අමාත්‍යාංශය වෙතින් ඉල්ලා සිටින ලදී. මෙම තීරණයද සමගින්, මහවැලි සංවර්ධන අමාත්‍යාංශය හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිය විෂය පථය යටතේ ඛනිජ සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම පවත්නේය යන කරුණ පෙන්වමින් ප්‍රතිපත්තිය නිමැවීමේ වගකීම භාරගන්නා ලදී. රේඛීය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශය යටතේ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම ප්‍රතිපත්තිය නිම කිරීමේ අරමුණින් සාකච්ඡා ගණනාවක් පවත්වන ලදී. අපගේ ඛනිජ සම්පත් භාවිතයෙන් අගය එක්කල නිෂ්පාදන අපනයනයෙන් වඩ වඩාත් රටට විදේශ විනිමය ගෙන එන අතර ආයෝජන තුළින් ලැබෙන්නාවූ ප්‍රතිලාභ ඉහළ නංවමින් අගය එක් කිරීමේ සිය සීමාවන් පුළුල් කරනු පිණිස ඛනිජ පදනම්ගත කර්මාන්තයන් සඳහා හැකියාව ලබාදෙන පරිසරයක් මෙම ප්‍රතිපත්තිය විසින් සම්පාදනය කරනු ඇත. මෙම ප්‍රතිපත්තියේ පවත්නා වැදගත්කම සැලකිල්ලට ගනිමින්, ප්‍රතිපත්තියට අදාළ කටයුතු අවසන් කිරීම වේගවත් කරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව අදාළ අමාත්‍යාංශ සමගින් නොකඩවා කටයුතු කරන ලදී.

02. දේශීය බීජ ප්‍රතිපත්තිය

2020 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් භාරගන්නා ලද බීජ සහතිකකරණ සේවා මධ්‍යස්ථානය සම්බන්ධ ආයතනික සමාලෝචනය මත පදනම්ව ජාතික බීජ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය නිර්දේශ කර ඇත. සැබැවින්ම, සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව තුළද දේශීය බීජ ප්‍රතිපත්තියක වැදගත්කම අවධාරණය කර ඇත. ඒ අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ බාහිර පාර්ශවකරුවන් සමග ඒකාබද්ධව ජාතික බීජ ප්‍රතිපත්තියක් ගොඩනැගීමේ ක්‍රියාවලිය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කර ඇත. කෙසේ වුවද, මේ සම්බන්ධ ප්‍රතිපත්තියක් සැකසීමේ කාර්යය කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ කමිටුවක් විසින් දැනටමත් ආරම්භ කර ඇත. එබැවින්, ක්‍රියාවලිය තුළ ද්විකරණය සිදු වීමේ හැකියාව වළකාලනු පිණිස, අදාළ බලධාරීන් විමසීමෙන් අනතුරුව මෙම ප්‍රතිපත්තියට අවශ්‍ය පහසුකම් සැලසීමේ කාර්යයෙහි ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව සම්බන්ධ නොවන බවට තීරණය කරන ලදී. කෙසේ වුවද, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අදහස් අවශ්‍ය සෑම අවස්ථාවකම, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් එය නොකඩවා ලබාදෙනු ඇත.

03. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළට දේශීය දෘෂ්ටි කෝණයන් ඇතුළත් කිරීම

04 2020 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය සම්බන්ධයෙන් සිදුකරන ලද ආයතනික සමාලෝචනය මත පදනම්ව, ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළට දේශීය සෞඛ්‍ය/ ආයුර්වේද ප්‍රතිපත්තිමය පැතිකඩයන් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයක් පවත්නා බව සමාලෝචක මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත. මෙමගින් ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ දැක්ම තුළ ප්‍රකාශිත පරිදි දේශීය වෛද්‍ය/ ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් ගොඩනැගීම සඳහා අවශ්‍ය විධිවිධාන සම්පාදනය කරනු ඇත. ඒ අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අවශ්‍ය පසු විපරම් කටයුතු සඳහා අදාළ සෞඛ්‍ය අංශ බලධාරීන් වෙත සමාලෝචනයේදී හඳුනාගත් කරුණු දැනටමත් දන්වා ඇත. අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අංශයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධව බාහිර පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමටද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

05 දකුණු කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමගින් සිදුකරන විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) සම්බන්ධ ඒකාබද්ධ ව්‍යාපෘතිය

2020 වසරේදී දකුණු කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය හා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව අතර ප්‍රතිපත්ති උපදේශන ව්‍යාපෘතිය යටතේ කෘෂි අංශයේ ඵලදායකත්වය, ක්‍රියාවලිය හා කෘෂි-ව්‍යවසායකත්වය වැඩිදියුණු කිරීමේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ප්‍රතිපත්ති මෙවලම් හඳුන්වා දීමේ කාර්යය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී. කෘෂිකර්ම අංශය මත කොවිඩ් 19 මගින් ඇති කරන ලද ඍණාත්මක බලපෑම් සලකා බලමින් කෘෂිකාර්මික අංශය ප්‍රමුඛ ක්ෂේත්‍රයක් ලෙස සලකන ලදී. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ හා විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනයේ නියෝජිතයන්ද සමගින් පවත්වන ලද මාර්ගගත සාකච්ඡාවන් ගණනාවකින් අනතුරුව විෂය සම්බන්ධයෙන් සංකල්ප පත්‍රිකාවක් සකස් කරන ලදී. ඒ අනුව, '(ප්‍රමුඛතාගත අපනයන භෝග 6ක් සඳහා වූ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයේ ඵලදායකත්වය, ක්‍රියාවලිය හා ව්‍යවසායකත්වය සඳහා වූ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයෙන් බල ගැන්වුණු ක්‍රියාකාරී සැලැස්ම' ගොඩනැගීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා නිලධාරීන් සමගින් දේශීය ව්‍යාපෘති උපදේශකයන් තිදෙනෙකු පත් කරන ලදී. මාර්ගගත රැස්වීම් ගණනාවක් හා මාර්ගගත වැඩමුළුවක්ද ඇතුළත් දකුණු කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනයේ උපදේශකවරුන්ගේ වැඩිදුර සමාලෝචනයන්ද සමගින් ක්‍රියාකාරී සැලැස්මේ පළමු හා දෙවන කෙටුම්පත් සකස් කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා යෙවන කටයුතු අමාත්‍යාංශයද ඇතුළත් අදාළ දේශීය බාහිර පාර්ශවකරුවන් සමගින් ක්‍රියාකාරී සැලැස්ම හා වැඩිදුර ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කරන ලදී. විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනයේ හා දේශීය ප්‍රවීණයන්ගේ අදහස් ඇතුළත් කෙරෙමින් අවසන් කරනු ලබන ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සලකා බලනු පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යවනු ඇත.





රූපය 3: විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතන ව්‍යාපෘතියේ බාහිර පාර්ශවකරුවන්ගේ රැස්වීම

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්යය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් වාර්ෂිකව රජයට වාර්තාවක් ඉදිරිපත් කිරීම

පසුගිය වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීමේ කාර්යය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත පවරා ඇත. මෙම වාර්තාව තුළ මානව සම්පත් සංවර්ධනය සඳහා ගෙන ඇති පියවරයන්හි ඵලදායිතාවය විද්‍යා හා තාක්ෂණ කාර්ය සාධනය, ආයතන, විද්‍යා හා තාක්ෂණ අංශයන්හි රජයේ වියදම්වල ඵලදායකත්වය හා පුද්ගලික අංශයේ ආයතනවල හා රාජ්‍ය අංශයේ කටයුතු තුළ විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගැනීම සඳහා වූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය තක්සේරු කිරීම අන්තර්ගත වේ.

01. 2018 විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව

මෙම අරමුණ හා අනුගතව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2018 වසර තුළ රාජ්‍ය අංශයේ විද්‍යා හා තාක්ෂණ ආයතන 40ක තත්ත්වය සමාලෝචනය කර ඇත. මේ හා සම්බන්ධව පුළුල් ක්ෂේත්‍ර පහක් තුළ ප්‍රශ්නාවලි සමීක්ෂණයක ආකාරයෙන් දත්ත රැස් කෙරිණි: i) මානව සම්පත්, ii) භෞතික සම්පත්, iii) පර්යේෂණ යෙදවුම්, iv) පර්යේෂණ නිමැවුම් හා v) විද්‍යා හා තාක්ෂණ ආයතන සේවාවන් වශයෙනි. ඒ ඒ ආයතනය වෙතින් ලද තොරතුරු මත පදනම්ව, දත්ත විශ්ලේෂණය සම්පූර්ණ කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවට හැකිවූ අතර, මේවන විට වර්තාව අවසන් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. වාර්තාව මෙම වසරේ තුන්වන කාර්තුව තුළ ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.



රූපය 4: විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2018

02. විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව 2019-2020

විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා සමගින් පවත්වන ලද සමාලෝචන රැස්වීමකදී ගන්නා ලද තීරණයක ප්‍රතිඵලයක් ලෙස 2019-2020 සඳහා දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය. මෙතුළ දත්ත රැස් කිරීමේ ආකෘතියට සිදුකළ වෙනස්කම්, දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයට සිදුකළ වෙනස්කම්, දත්ත රැස් කිරීම සෙසු සමාන ආයතන සමගින් ඒකාබද්ධ කිරීම හා වාර්තාකරණ ආකෘති ආදිය ඇතුළත් වේ.

එබැවින්, දැක්මක් තුළ රටේ සැබෑ විද්‍යා හා තාක්ෂණ තත්ත්වය පිළිබිඹු කරන සාමූහික ප්‍රවේශයක් මගින්, කොමිෂන් සභාවේ එකඟතාවය සහිතව, අමාත්‍යාංශයේ සැලකිල්ලට ලක්වන කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා යොදාගන්නා ලද නව ක්‍රමවේදයක් සහිතව 2021 වසර තුළ 2019/2020 වාර්තාව පළ කෙරෙනු ඇත. මේ හා අනුගතව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් විශේෂයෙන් අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාගැනීම සම්බන්ධයෙන් විස්තීර්ණ ආංශික වාර්තාවක් සකස් කිරීම සඳහා ගැටලු හඳුනා ගැනීමේ කාර්යයෙහි නිරතව සිටී.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය

පනතේ 2 වගන්තිය තුළ පනවා ඇති අරමුණු ආශ්‍රිතව විද්‍යා හා තාක්ෂණ ආයතන සමාලෝචනය කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත නියම කර ඇත.

ජාතික ප්‍රමුඛතාවයන් හා ඉලක්කයන් සපුරාලන බවට තහවුරු කරනු පිණිස මෙම ආයතනයන් විසින් සිදුකරන විද්‍යා හා තාක්ෂණ කටයුතුවල ගුණාත්මකභාවය, පිරිවැය ඵලදායකත්වය, අදාළත්වය, හා බලපෑම තක්සේරු කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන බාහිර මණ්ඩලයන් විසින් සමාලෝචනයන් සිදු කෙරේ. සමාලෝචනයන් මාර්ගෝපදේශ අත් පොතක් මත පදනම්ව සිදුකරන අතර, අවශ්‍ය තොරතුරු ආයතන වෙතින් හා බාහිර පාර්ශව විමසුම් මගින් ඒකරාශි කෙරේ.

සමාලෝචන ක්‍රියාවලිය තුළ එකිනෙක වෙනස් අදියර 4කින් සමන්විත වේ..

- සමාලෝචනය සඳහා සූදානම් වීම
- සමාලෝචන කණ්ඩායම විසින් ආයතන සමාලෝචනය සිදුකිරීම.
- සමාලෝචන කණ්ඩායම විසින් කෙටුම්පත් වාර්තාව සකස් කිරීම
- සමාලෝචන කණ්ඩායම විසින් සකසන ලද අවසන් වාර්ථාව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම

2020 විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධන සමාලෝචනයට අදාළ සමස්ත ක්‍රියාවලියම ක්ෂේත්‍ර නිරීක්ෂණ හා සාකච්ඡා මත පදනම් වන බැවින් වර්තමාන කොවිඩ් 19 වසංගත තත්ත්වයන් හේතුවෙන් සැලකිය යුතු බලපෑමක් එම ක්‍රියාවලියට ඇතිවිය. කෙසේ වුවද, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 වසර තුළ සමාලෝචන 7ක් ආරම්භ කිරීමට සමත් විය.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 වසර තුළ ඒ ඒ සමාලෝචන මණ්ඩලයන් වෙතින් පහත සඳහන් සමාලෝචන වාර්තා ලබාදුන් අතර ඒවා කොමිෂන් සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාවලිය හා අනුගතව, කොමිෂන් සභාව විසින් එම වාර්තා අධ්‍යයනය කර ඒවා අනුමැතිය සඳහා නිර්දේශ ලබා දීම පිණිස කොමිෂන් සාමාජිකයන්ගෙන් සැදුම්ලත් අනු-කමිටු දෙකක් පත් කරන ලදී.

1. ශාක ආරක්ෂණ සේවා (PPS), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
2. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය (BMARI)





රූපය 5 : ශාක ආරක්ෂණ සේවයේ හා බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ කාර්යක්ෂමතා සමාලෝචන වාර්තා

මින් ඉහත ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් විෂය භාර අමාත්‍යාංශය වෙත හා අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතනයන් වෙත සමාලෝචන නිර්දේශ ලබාදෙන ලදී. කෙසේ වුවද, බොහෝ විටම, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තරම් බරපතල සේ සැලකිල්ලට නොගන්නා ලදී. ආයතනික සමාලෝචනයේ එන නිර්දේශ ක්‍රියාත්මක කරන බවට වගබලා ගනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ඵලදායී කාර්ය සාධන නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපනය කරනු වස් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාවක් පවත්වන ලදී. සිය කාර්ය සාධන විගණන ක්‍රියාවලිය තුළ මෙකරුණ ඇතුළත් කිරීම සඳහා ධනාත්මක එකඟතාවයක් පළකළ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින්, අදාල ආයතනයනට අමතරව භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යාංශය වෙතද සමාලෝචන වාර්තා පිටපත් යවන ලෙස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින ලදී.

විද්‍යා හා තාක්ෂණ ආයතනයන්ගේ කාර්ය සාධන සමාලෝචන විස්තර පහත පරිදි වේ.

1. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

1957 අංක 49 දරන රජයේ කර්මාන්ත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාර 1974දී ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලද අතර, මේවන විට එය නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය යනු දේශීය ඉංජිනේරු හා තාක්ෂණික පර්යේෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රවර්ධනය කරමින් ඒ සඳහා පහසුකම් සැලසීමේ මූලික අරමුණ සහිතව පෙරකී පනත යටතේ ස්ථාපනය කරන ලද ප්‍රමුඛතම ආයතනයන් අතරින් එකකි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 වසරේදී ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සමාලෝචන කටයුතු ආරම්භ කරන ලද අතර, එම සමාලෝචන කාර්යය සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයන් පත්කරනු ලැබ ඇත:

1. මහාචාර්ය ආනන්ද ජයවර්ධන මහතා (සභාපති)
2. ශිරෝමාල් ප්‍රනාන්දු මහතා
3. මහාචාර්ය බුද්ධික පී. ජයසේකර මහතා

මණ්ඩලය 2020 අගෝස්තු මස 8 හා 9 දිනයන්හි ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත සමාලෝචන චාරිකාවක නිරත වූ අතර, එහි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා පවත්වන ලදී. එම මණ්ඩලය විසින් පවත්නා පරීක්ෂණ පහසුකම්, වැඩ ශාලාවන් හා තාක්ෂණ උද්‍යානය වෙතද චාරිකා කරන ලදී. විවිධ තාක්ෂණ කාණ්ඩයන්හි බලපත්ලාභීන්, සේවාදායකයන්, හා සැපයුම්කරුවන්ද නියෝජනය කරන බාහිර පාර්ශවකරුවන් 37 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2020 දෙසැම්බර් මස 11වන දින මාර්ගගත වැඩමුළුවක් ලෙස zoom යෙදවුම් භාවිතයෙන් බාහිර පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදී.



රූපය 6 : ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථාන (NERDC) කාර්ය සාධන සමාලෝචනය

2. ජාතික විද්‍යා පදනම (NSF)

1994 අංක 11 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත ජාතික විද්‍යා පදනම (NSF) වූකලි අත්‍යවශ්‍යයෙන්ම ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ අංශය වෙත සේවය සලසමින් එය බලගැන්වීම සඳහා වරම් ලබාදී ඇති සේවා ආයතනයකි. ප්‍රධාන වැඩසටහන් ගණනාවක් මගින්, ආයතනය විසින් පර්යේෂණ, සංවර්ධන හා නවෝත්පාදනයන් මෙන්ම විද්‍යා හා තාක්ෂණ ධාරිතාවයද ප්‍රවර්ධනය කරමින් ඒවාට සහාය ලබාදෙනු ලබයි. එමගින් විද්‍යාව ජනප්‍රිය කරනු පිණිස විවිධ වැඩසටහන් හා ක්‍රියාකාරකම්ද පවත්වන අතර, විද්‍යා හා තාක්ෂණ තොරතුරු ප්‍රචාරණයේ ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරමින් රටේ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනු ලබයි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පළමු සමාලෝචන මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව 2020 අගෝස්තු මස 20වන දින ජාතික විද්‍යා පදනමට අදාළ සමාලෝචන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම සමාලෝචන මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. මහාචාර්ය (වෛද්‍ය) මංජුල පී. එස්. මාගමගේ මහතා (සභාපති)

2. මහාචාර්ය තියඩෝර් ඇලෙක්සැන්ඩර් ප්‍රනාන්දු මහතා

3. ශාන්ත වීරසිංහ මහතා

මෙම මණ්ඩලය විසින් 2020 සැප්තැම්බර් මස 10වන දින ජාතික විද්‍යා පදනම වෙත සමාලෝචන සංචාරය සිදුකරන ලද අතර, එහි සභාපති, වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් හා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමගින්ද සාකච්ඡා පවත්වන ලදී. බාහිර පාර්ශවකරුවන්ගේ සමාලෝචන මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලද ඒ ඒ පාර්ශ්වයන් සමගින් අදහස් විමසුම් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මණ්ඩලය විසින් 2021 පළමු කාර්තුව තුළ අදාළ සමාලෝචන ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.



රූපය 7 : ජාතික විද්‍යා පදනමේ කාර්ය සාධන සමාලෝචනය

3. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ වගකීම වන්නේ නැනෝ තාක්ෂණය හා උසස් තාක්ෂණයන් පිළිබඳ විශේෂඥතාවය සහිත ලෝක මට්ටමේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයක් ගොඩනැගීම සහ ශ්‍රී ලංකාව තුළ විද්‍යා හා තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීම සඳහා නැනෝ තාක්ෂණ හා විද්‍යා උද්‍යානයෙහි පර්යේෂණ පහසුකම් ස්ථානගත කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර සේවාදායකයන් ආකර්ශනය කරගැනීමයි.

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ සමාලෝචන කාර්යය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විශේෂඥ මණ්ඩලයකින් ආරම්භ විය:

1. මහාචාර්ය ආර්. එම්. ජී. රාජපක්ෂ මහතා (සභාපති)
2. මහාචාර්ය පී.ජී.ආර්. ධර්මරත්න මහතා
3. ආචාර්ය අතුල සේනාරත්න මහතා

මණ්ඩලය විසින් 2020 අගෝස්තු මස 26වන දින සමාලෝචන සංචාරය සිදුකළ අතර, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය සමග සාකච්ඡා පවත්වන ලදුව පවත්නා පරීක්ෂණ පහසුකම්ද නිරීක්ෂණය කරන ලදී. මෙම සමාලෝචන ක්‍රියාවලිය 2021 පළමු කාර්තුව තුළ අවසන් කිරීමට අපේක්ෂිතය



රූපය 8 : ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) කාර්ය සාධන සමාලෝචනය

4. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ විෂය පථය යටතේ එන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) (1998 අංක 53 දරන) පාර්ලිමේන්තු පනතින් 1999 වසරේදී ස්ථාපනය කරන ලදී. එය ශ්‍රී ලංකාවේ ජලජීවී වගා හා දේශීය ධීවර අංශය සංවර්ධනය කිරීමේ වරම ලබාදී ඇති ප්‍රධාන රාජ්‍ය අනුග්‍රහය සහිත ආයතනය වේ.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම ආයතනය 2020 සැප්තැම්බර් මාසය තුළ ආරම්භ කරන ලද අතර, මේ සඳහා පහත සඳහන් මණ්ඩල සාමාජිකයන් පත් කරන ලදී -

1. මහාචාර්ය ජේ. එම්. පී. කේ. ජයසිංහ මහතා (සභාපති)
2. මහාචාර්ය උපාලි එස්. අමරසිංහ මහතා
3. මහාචාර්ය කේ. එච්. එම්. අශෝක දීපානන්ද මහතා

2020 සැප්තැම්බර් මස 25වන දින සමාලෝචන සංචාරයක නිරත වූ මණ්ඩලය විසින් වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ආයතනයේ කළමනාකරිත්වය හමුවිය.



රූපය 9 : ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ (NAQDA) කාර්ය සාධන සමාලෝචනය

4. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

කාර්මික තාක්ෂණ ආයතනය (ITI) යනු රජය සතු බහු විෂයගත පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් වන අතර එමගින් ඉල්ලුමට අනුව සිදුවන පර්යේෂණ හා සංවර්ධනයන් සහ ජාත්‍යන්තර මට්ටමේ

තරගකාරී තාක්ෂණික සේවාවන් සිදු කරනු ලබයි. මෙම ආයතනය 1955දී ස්ථාපනය කරන ලද ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ (CISIR) අනුප්‍රාප්තික ආයතනය වේ.

කාර්මික තාක්ෂණ ආයතනයේ සමාලෝචන මණ්ඩලය පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

1. ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා (සභාපති)
2. මහාචාර්ය ප්‍රියානි අශෝකා පරණගම මහත්මිය
3. ඩී.ඒ. ශ්‍රියානි සකුන්තලා තෙන්නකෝන් මහත්මිය

2020 ඔක්තෝබර් මස 09වන දින, මෙම විශේෂඥ මණ්ඩලය ආයතනයට පැමිණ අදාළ කාර්ය මණ්ඩලය සමඟින් රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. කාර්මික තාක්ෂණ ආයතන සමාලෝචන කාර්යය 2021 පළමු කාර්තුව තුළ අවසන් කිරීමට අපේක්ෂිතය.
කොවිඩ් 19 වසංගත තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරේ මුල් භාගය තුළ ආරම්භ කරන ලද සමාලෝචන 2021 පළමු කාර්තුව තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.



රූපය 10 : කාර්මික තාක්ෂණ ආයතනය (ITI) කාර්ය සාධන සමාලෝචනය

5. රබර් පර්යේෂණායතනය (RRI)

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය රබර් සම්බන්ධ ලොව පැරණිතම පර්යේෂණායතනය වන අතර, රබර් කර්මාන්තයේ යහ සාධනය පිණිස රබර් වගාව හා පිරිසැකසුම්කරණයට අදාළ සියලු පැතිකඩයන් සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම සහිත ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ආයතනයද වේ.

රබර් පර්යේෂණායතනයේ සමාලෝචන කටයුතු පහත විශේෂඥ මණ්ඩලය විසින් 2020 සැප්තැම්බර් මස 15වන දින ආරම්භ කරන ලදී:

1. ආචාර්ය අයි. ජේ. ද සොයිසා මහත්මිය (සභාපති)
2. ආචාර්ය කුමුදිනි ගුණසේකර මහත්මිය
3. ඒ. ඒ. එම්. ටී. අධිකාරී මහතා

කොවිඩ් 19 වසංගත තත්ත්වයෙහි ප්‍රතිඵලයක් ලෙස, ඇතැම් ප්‍රදේශ අගුලු දමන ලද අතර, සැලසුම්ගත කාල පරිච්ඡේදයට අනුව මණ්ඩලයට සිය සමාලෝචන කටයුතු ඉදිරියට ගෙන යාමට නොහැකි විය. එබැවින්, රබර් පර්යේෂණායතනයේ සමාලෝචන කටයුතු 2021 දෙවන කාර්තුව තුළ සම්පූර්ණ කෙරෙනු ඇත.



රූපය 11 : රබර් පර්යේෂණායතනයේ (RRI) කාර්ය සාධන සමාලෝචනය

4. පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් (ROP)

පලිබෝධ නාශක රෙජිස්ට්‍රාර් ආයතනයට අදාළ සමාලෝචනය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලද නමුත් , කොවිඩ් වසංගත තත්ත්වය හේතුකොට එය සැලසුම්ගත ලෙස ආරම්භ කිරීමට නොහැකි වූ අතර, 2021 දී ආරම්භ කෙරෙනු ඇත.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්යය (4): අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්ට සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට පෙර ඒවාහි අදහස් ලබාගැනීම

විද්‍යා හා තාක්ෂණ (S&T) සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම

ප්‍රතිපත්තිමය අඩුපාඩු හා අවශ්‍යතාවයන් හඳුනාගනු පිණිස විද්‍යාඥයන්, ඉංජිනේරුවන් හා පර්යේෂකයන් පෙළ ගැස්වීම

01. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF)

ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයන්ගේ සංසදය වෙත විද්‍යා හා තාක්ෂණයට අදාළ සිය අදහස් ප්‍රකාශ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන් වෙත අවස්ථාවක් ලබාදීම සඳහා 2000 වසරේ සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සත්කාරකත්වය ලබා දෙන ලදී. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය මේවන විට විවිධ විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරන තරුණ විද්‍යාඥයන්ගෙන් සැදුම්ලත් සාමාජිකයන් 400කට වැඩි පිරිසකගෙන් සමන්විත වේ.

I. <u>තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ විධායක කමිටුව</u>

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සැදුම්ලත් විධායක කමිටුවකින් සමන්විත වේ. විධායක කමිටුව සම ලේකම්වරුන් දෙදෙනෙකුද සමගින් සභාපතිවරයාගේ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ. සෑම වසරකම, තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය වද සමගින් සාමාන්‍යයෙන් පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීම අතරතුර නව විධායක කමිටුවක් තෝරා පත් කරගනු ලැබේ. කොවිඩ් වසංගතයෙහි ප්‍රතිඵලයක් ලෙස වාර්ෂික මහා සභා රැස්වීම නොපවත්වන ලද බැවින් 2019 විධායක කමිටුව 2020 විධායක කමිටුව ලෙසද කටයුතු කරන ලදී.

2020 තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ විධායක කමිටුව

සභාපති	ආචාර්ය ලසන්ත වීරසිංහ මහතා	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
සම සභාපති	ආචාර්ය උපනිත් ලියනාරච්චි මහතා	තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
සම ලේකම්	ආචාර්ය කසුන් මීගහකුඹුර මහතා	පොල් පර්යේෂණායතනය, ලුණුවිල
කාරක සභික	මහාචාර්ය උෂා හෙට්ටිආරච්චි මහත්මිය	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය දිනේෂ් ආටිගල මහතා	ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
කාරක සභික	මහාචාර්ය රංගිකා හල්වතුර මහත්මිය	ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය සමන්ත දිසානායක මහතා	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය කන්දයියා පකීරාදන් මහතා	කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය සමීර සමරකොන් මහතා	ජෛව රසායන විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා හා ජීව තාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය නිරෝෂිමා විතානගේ මහත්මිය	වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
කාරක සභික	ආචාර්ය ජානක විජේසිංහ මහතා	සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
කාරක සභික	ඊ. එම්. එස්. ඉසන්කා මිය	කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ 07
කාරක සභික	එන්. වයි. ජයනාත් මහතා	කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා සම්බන්ධීකාරක	තිළිණි මූණගමගේ මෙනවිය	ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව




රූපය 22 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ විධායක කමිටු රැස්වීම

II. තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ 9වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2020

2012දී ආරම්භ කරන ලද තරුණ විද්‍යාඥයන්ගේ සංසද පර්යේෂණ සමූළුව ජාලකරණ හා තාක්ෂණික ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා අවකාශයක් නිර්මාණය කරමින් විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සොයාගැනීම් හා පර්යේෂණ අභිලාශයන්ද බෙදා හදා ගනිමින් සාමූහික පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණ විද්‍යාඥයන් වෙත වේදිකාවක් සැපයීමේ ප්‍රධාන අරමුණ සහිතව ජනප්‍රිය වැඩසටහනක් බවට පත්ව ඇත.

පර්යේෂණ පත්‍රිකා ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට ප්‍රතිචාරව 2019 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත තරුණ විද්‍යාඥයන්ගේ සංසදය වෙතින් විස්තීර්ණ සාරාංශයන් (EA) 85ක් ලැබිණි. ඒ එක් එක් විස්තීර්ණ සාරාංශය ද්විත්ව තිර සමාලෝචන ක්‍රියාවලියක් තුළින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක් කරන ලදී. ඔවුන්ගේ නිර්දේශ මත පදනම්ව, වාචික ඉදිරිපත් කිරීම් සඳහා විස්තීර්ණ සාරාංශ 52ක් තෝරා ගන්නා ලදී. ක්‍රියාවලිය තුළදී ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් පර්යේෂණ පත්‍රිකා ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරන ලදී.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන ලෝක විද්‍යා දිනය හා ජාතික විද්‍යා සති සැමරුමට සමාන්තරව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් Zoom වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම හරහා මාර්ගගත වැඩසටහනක් ලෙස 2020 නොවැම්බර් මස 13වන දින 9වන තරුණ විද්‍යාඥයන්ගේ සංසද පර්යේෂණ සමූළුව සංවිධානය කරන ලදී.

මාර්ගගත වේදිකාවක් මත ආරාධිතයන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් සමාරම්භක උත්සවයකින් මෙම සම්මන්ත්‍රණය ආරම්භ කරන ලද අතර, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් පද්මා රාජපක්ෂ මහත්මිය විසින් ප්‍රධාන ආරාධිත අමුත්තිය වශයෙන් රැස්ව සිටි පිරිස ආමන්ත්‍රණය කරන ලදී. රයිගම් ආයතනයේ සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී හා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සාමාජික ආචාර්ය රවි ලියනගේ මහතා විසින් ප්‍රධාන දේශනය සිදුකරන ලද අතර, 2018 තරුණ විද්‍යාඥ සම්මානලාභී මහාචාර්ය මෙත්තිකා විතානගේ මහත්මිය විසින් එම මාර්ගගත රැස්වීමේ ආරාධිත දේශනය සිදුකරන ලදී.

සමාන්තර තාක්ෂණික සැසි හතක් තුළ මාර්ගගතව ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා සාරාංශ 51ක් ඉදිරිපත් කරමින් සමූළුවේ කටයුතු සිදුවිය. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මෙම මාර්ගගත සමූළුව සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුවේ (NRDF) පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ මාර්ගගත වාචික ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී:

- සෞඛ්‍යය,
- ආහාර, පෝෂණය හා කෘෂිකර්මය.
- පරිසරය,
- බලශක්තිය,
- රෙදිපිළි හා ඇඟළුම්,
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා දැනුම් සේවාවන්,
- මූලික විද්‍යාව හා නැගී එන තාක්ෂණයන් හා දේශීය දැනුම



රූපය 33 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ 09වන මාර්ගගත සමුළුව

II. *තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පර්යේෂණ සංඛ්‍යාන සම්බන්ධ වැඩමුළුව*

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් ‘‘පර්යේෂණ සඳහා අවශ්‍ය සංඛ්‍යාන පිළිබඳ වැඩමුළුව’’ යන නමින් කුලියාපිටියේ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේදී (ICTC) ආරම්භක වෘත්තීය පර්යේෂකයන් වෙනුවෙන් දෙදින නිපුණතා සංවර්ධන වැඩමුළුවක් සංවිධානය කරන ලදී. වැඩමුළුව ‘‘සාර්ථක දත්ත විශ්ලේෂණයක් සඳහා වූ පියවර’’, ‘‘උපකල්පන පරීක්ෂණය’’, ‘‘නිදර්ශකකරණය හා අත්හදා බැලීමේ සැලසුම්’’, ‘‘වෙනස්කම් විමසා බැලීමේ පරීක්ෂණය’’ හා ‘‘දත්ත ගවේශනයන් සඳහා වූ සබඳතා හා පරීක්ෂණ’’ යන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධ පහත සඳහන් සම්පත් දායකයන් විසින් පවත්වන ලද දේශන හා ප්‍රායෝගික සැසිවලින් සමන්විත විය.

- මහාචාර්ය ආර්. ඕ. තටිල් මහතා , සම්මානිත මහාචාර්ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- මහාචාර්ය එස්, සමිත මහතා, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

- මහාචාර්ය එන්. ආර්. අබේනායක මහත්මිය , මහාචාර්ය, කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය කේ. ඩබ්. එල්. කේ. වීරසිංහ මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය



රූපය 14 : පර්යේෂණ සඳහා වූ සංඛ්‍යාන පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව

IV. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය (SSF)

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය යනු ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන් අතර විද්‍යා හා තාක්ෂණ අංශය සම්බන්ධව පවත්නා සහයෝගිතාව දිරිමත් කරමින් ශක්තිමත් කිරීමේ හා ඔවුන් විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයට අදාළ ප්‍රතිපත්ති (STI) සකස් කිරීමේ හා සමාලෝචන කාර්යයෙහි යෙදවීමේ අරමුණු සහිතව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද උපදේශන සංසද අතරින් එකකි. 2001 වසරේදී ආරම්භ කරන ලද ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය 2010 වසර දක්වා දශකයක කාලයක් පුරා සක්‍රීයව පැවතිණි. කෙසේ වුවද, විවිධ බාධාවන් හේතුකොට, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ගේ සංසදය වසර 10ක් පුරා සක්‍රීයව නොපැවති අතර, ජාතික ප්‍රමුඛතා අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ උපදේශන කටයුතු සඳහා අරමුණු සහාය ලබාගැනීම විශේෂ කොටගෙන 2020 වසරේදී ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය නැවත සක්‍රිය කිරීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

ආරම්භක වැඩසටහන ලෙස, සංසදයේ ඉදිරි ගමන හා ඒ ආශ්‍රිත කටයුතු සාකච්ඡා කරනු පිණිස 2020 ඔක්තෝබර් මස 16වන දින අඩදින වැඩමුළුවක් ලෙස පවත්වන්නට සැලසුම් කොට තිබූ අතර, ඒ සඳහා විද්‍යා හා තාක්ෂණායතනයන්ගෙන් හා විශ්වවිද්‍යාලයන් වෙතින්ද ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්/ ඉංජිනේරුවන්/ ශාස්ත්‍රාලයීය උගතුන් 125 ඉක්මවූ සංඛ්‍යාවක් සහභාගි වීම සඳහා ලියාපදිංචිය ලබාගන්නා ලදී. කෙසේ වුවද, 2020 ඔක්තෝබර් මස ආරම්භයේදී කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල හදිසියේ මතුවීම හා විශාල වශයෙන් පුද්ගල ඒකරාශිවීම් වළකාලීම සඳහා රජය විසින් ගන්නා ලද තීරණයද හේතුකොට, එම වැඩමුළුව 2021 දක්වා කල් තබන ලදී.

ජාත්‍යන්තර කටයුතු

නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre)

1989 සිට ඉන්දියානු රජයේ අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක අන්තර් රාජ්‍ය සංවිධානයක් වන නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre, www.namstct.org) විද්‍යා හා තාක්ෂණ අංශයන්හි දකුණු - දකුණු සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමේ කාර්යයෙහි ඉතා සක්‍රීය ආයතනයක් වේ. ශ්‍රී ලංකාව ලතින් ඇමරිකා, අප්‍රිකානු, ආසියානු හා යුරෝපීය මහාද්වීප වල පැතිර ඇති මධ්‍යස්ථානයේ ගෞරවාන්විත සාමාජික රටවල් 47 අතරින් එකකි. සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සමඟින් නොබැඳී විද්‍යාඥයන්, තාක්ෂණඥයන්, හා විද්‍යාත්මක සංවිධානයන් අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සමඟින් සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය වරප්‍රසාද එමඟින් සම්පාදනය කරනු ලබයි.

මේ දක්වා නොබැඳි හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ පවත්වන ලද ජාත්‍යන්තර වැඩසටහන් හතක්ද ඇතුළත්ව විද්‍යාත්මක හා තාක්ෂණික මානෘකා පෙළක් සම්බන්ධයෙන් විවිධ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් තුළ ජාත්‍යන්තර වැඩමුළු හා පුහුණු පාඨමාලා 80ක පමණ සංඛ්‍යාවක් සංවිධානය කර ඇත.

ශ්‍රී ලාංකිකයන් විශාල සංඛ්‍යාවක්ද ඇතුළත්ව ලෝකය පුරා සිටින සුවිශාල සංඛ්‍යාවක් වූ පර්යේෂකයන් හා වෘත්තිකයන් සංඛ්‍යාවක් වෙතද මෙම අවස්ථාවන් තුළින් ප්‍රතිලාභ අත්ව ඇත. 2004, 2010 හා 2018 වර්ෂයන් ලෙස තෙවරක් නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ විද්‍යා හා තාක්ෂණ (NAM S&T) මධ්‍යස්ථාන පාලක මණ්ඩල කාර්යාංශ රැස්වීම්වලට ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය ලබාදී ඇත. 15වන නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ විද්‍යා හා තාක්ෂණ (NAM S&T) මධ්‍යස්ථාන පාලක මණ්ඩල කාර්යාංශ රැස්වීම ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ පැවැත්වීමට කටයුතු යොදා තිබූ නමුදු කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොට බහුතර සාමාජික රටවල් තුළ පවත්නා තත්ත්වය හේතුකොට එය නැවත 2021 වසරට සැලසුම් කරන ලදී.

නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මධ්‍යස්ථානයේ සාමාජික රටවල් විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු හා සෙසු කෙටි කාලීන හා මධ්‍ය කාලීන පුහුණු වැඩසටහන්වලටද සහභාගි වීම සඳහා විද්‍යාඥයන් හා සෙසු නිලධාරීන් වෙත අවස්ථාවන් සම්පාදනය කරනු ලබයි. මධ්‍යස්ථානය විසින් ගුවන් ගාස්තු ලබාදෙන අතර සහභාගිකරුවන් වෙත නවාතැන් පහසුකම් සත්කාරක රට විසින් ලබාදෙනු ලබයි.

2020 වසර තුළ, මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වැඩසටහන්වලට පහත සඳහන් ශ්‍රී ලාංකික විද්‍යාඥයෝ සහභාගි වූහ:

- **‘වායු දූෂණය හා මහජන සෞඛ්‍යය: අභියෝග හා මැදිහත්කරණයන්’ සම්බන්ධ ජාත්‍යන්තර වැඩමුළුව, නව දිල්ලිය, ඉන්දියාව, 2020 පෙබරවාරි 5-7 දක්වා.**
  ආචාර්ය තම්මිට ඒ.එස්. අනුරුද්ධ, ප්‍රධාන පර්යේෂණ විද්‍යාඥ, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)

- **‘පොදු වර්ගයේ ඖෂධ’ පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන, 2020 නොවැම්බර් මස 19වන දින (දූරස්ථ මාර්ගගත මාදිලිය)**

ආචාර්ය නයනා විජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සත්ත්ව චිකිත්සක විද්‍යා අධ්‍යයනාංශය, සත්ත්ව වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
සහ
ආචාර්ය කේ.ජී.ඒ.පී. අත්තනායක, අංශ ප්‍රධානී හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජීව රසායන විද්‍යා අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය

- **'සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා වූ තාක්ෂණ ව්‍යවසායකත්වය: සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සඳහා වූ තාක්ෂණ හුවමාරුවේ පවත්නා අභියෝග හා අවස්ථා සහ වාණිජකරණය', නොවැම්බර් 24-5 (අන්තර්ජාල මාර්ගගත මාදිලිය)**
  නෂීමා අහමඩ මහත්මිය, අධ්‍යක්ෂ (සැලසුම්), නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
  පී. ඒ. එම්. ජේ. විජේපාල මිය, විද්‍යාඥ, ජාතික ජලජීවී සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය
  සහ
  ආචාර්ය කේ.ඩබ්. සුජීව ආරියවංශ, ප්‍රධාන විද්‍යාඥ, ජාතික ජලජීවී සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොට, 2020 වසර වෙනුවෙන් සැලසුම් කරන ලද නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල මධ්‍යස්ථානයේ වැඩමුළු හා සාමාජිකත්ව වැඩසටහන් අතරින් අති බහුතරයක් කල් තැබීමට හෝ මාර්ගගත මාදිලියෙන් පවත්වන්නට සිදුවිය.

මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ උපදේශක කටයුතු ලබා දෙන ඉහළම ආයතනය ලෙස නස්ටෙක් ආයතනය නම් කර ඇත. ඉහත කර්තව්‍යය ඉටු කිරීම සඳහා ආයතනික අරමුණු හා පරමාරථයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා කණ්ඩායමක් ලෙස නස්ටෙක් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර රටේ විද්‍යා හා තාක්ෂණයේ සංවර්ධනය සඳහාද සේවා සපයනු ලබයි.

නස්ටෙක් හි ආයතනික ව්‍යුහයට අනුව සභාපති කොමිෂන් සභාවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ. ජ්‍යෙෂඨ විද්‍යාඥ විසින් විශේෂඥ අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශන සංසද මෙන්ම නස්ටෙක් හි අනෙකුත් සියලුම විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයමින් ඒවා සම්බන්ධීකරණය හා කළමනාකරණය කරනු ලබයි. සියළුම මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන) වගකිව යුතුය. විද්‍යාඥයින් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින්ට සහාය වන අතර අධ්‍යයන කණ්ඩායම් සහ උපදේශන සංසද සහ නස්ටෙක්හි අනෙකුත් අදාළ විද්‍යාත්මක ක්‍රියාකාරකම් කළමනාකරණය කරනු ලබයි. සහායක කාර්ය මණ්ඩලය, පරිපාලන නිලධාරී, වැඩසටහන් සහායකයින් දෙදෙනෙකු (වැඩසටහන් සහකාර-මූල්‍ය හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දත්ත ගබඩා සහායක), කළමනාකරණ සේවා සහායකයින් පස් දෙනෙකු, කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු සහ රියදුරන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කොමිසම් සභාවට අවශ්‍ය පරිදි විශේෂිත කාර්යයන් හා පැවරුම් ඉටු කිරීම සඳහා, අවශ්‍යතා මත පදනම්ව උපදේශකයින් සහ පර්යේෂණ සහායකයින් ගෙවීමේ පදනම මත ලබා ගනු ලැබේ.

2020.12.31 දිනට කාර්ය මණ්ඩල ප්‍රමාණයට අදාළ තොරතුරු සාරාංශය

කාර්ය මණ්ඩල කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව
ඉහළ කළමනාකාරිත්වය (HM 2-3)	01	01
විද්‍යාඥ (AR -2, AR -1)	04	03
මධ්‍යම කළමනාකරු (MM 1-1)	01	01
කණිෂ්ඨ කළමනාකරු (JM 1-2)	01	01
කළමනාකරණ සහකරුවන් (MA – 3)	02*	02
කළමනාකරණ සහකරුවන් (MA - 1-2)	05	02
ප්‍රාථමික මට්ටම (PL 1)	05	04

02* වැඩසටහන් සහකාර - මුදල් තනතුර එය දරනු ලබන නිලධාරියාට පුද්ගලිකය.

කාර්ය මණ්ඩල පුවත්

- ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් 2020 ජනවාරි මස 16වන දින එම කොමිෂන් සභාවේ සභාපති ධුරයට මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මහත්මිය උණුසුම් ලෙස පිළිගත් අතර, එතුමිය 2020 දෙසැම්බර් මස 31වන දින දක්වා එම තනතුරෙහි සේවය කළාය. අභ්‍යන්තර

පරිපාලන ගැටලු නිරාකරණය විශේෂ කොටගෙන ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය සාධනය නංවාලීමෙහි ලා එතුමිය විසින් ලබාදෙන ලද සක්‍රීය දායකත්වය වෙනුවෙන් එතුමියට ස්තුතිවන්ත වෙමු.

- මහාචාර්ය නිරන්ජනී රත්නායක මහත්මිය 2020 දෙසැම්බර් මස 31වන දින කොමිෂන් සභා සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ අතර එතුමියටද කොමිෂන් සභා සාමාජිකාවක ලෙස සිදුකරන ලද සේවය වෙනුවෙන් ස්තුතිය පළ කරමු.

- නන්දනී සමරවික්‍රම මහත්මිය 2019 ජුනි මස 20වන දින සිට 2020 ජනවාරි මස 26වන දින දක්වා වැඩබලන අධ්‍යක්ෂිකාවක ලෙස කටයුතු කළ අතර එතුමියගේ ධුර කාලය තුළ ඉටු කරන ලද සේවය වෙනුවෙන් එතුමියටද කෘතවේදිත්වය පළ කරමු.

- 2020 ජනවාරි මස 27වන දින සිට 2020 මැයි මස 31වන දින දක්වා වැඩබලන අධ්‍යක්ෂ ධුරයෙහි කටයුතු කළ ආචාර්ය තමරා එෆ්. ඩයස් මහත්මියටද එතුමිය විසින් ඉටුකරන ලද සේවය වෙනුවෙන් කෘතඥතාවය පළ කරමු.

- 2020 මාර්තු මස 16වන දින කණිෂ්ක ගිම්හාන් මහතා කාර්යාල කාර්ය සහායක තනතුරින් ඉල්ලා අස්වූ අතර, ඒ මහතා වෙතද ඉටුකරන ලද සේවය වෙනුවෙන් කෘතවේදී වන්නෙමු.

- ආචාර්ය කල්ප ඩබ්. සමරකෝන් මහතා 2020 දෙසැම්බර් මස 21වන දින ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෙකු ලෙස එතුමා දැරූ තනතුරින් ඉල්ලා අස්වූ අතර කොරියන් විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය (STEPI) සමගින් ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කිරීම විශේෂ කොටගෙන සිය ධුර කාලය තුළ ඉටු කරන ලද සේවය වෙනුවෙන් එතුමා හටද කෘතඥතාවය පළ කරමු

ධාරිතා සංවර්ධන / ගෘහස්ත හා බාහිර පුහුණු වැඩසටහන්

රජය විසින් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් රටතුළ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුකොට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සැලසුම්ගත පුහුණු වැඩසටහන් කල් තබන ලදී.

සුභසාධන කටයුතු

2020 වසර තුළ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සුභසාධක සංගමය විසින් සිදුකරන ලද වැඩසටහන් හා උත්සව පහත පරිදි වේ:

- **නිතිපතා සිදුකරන කටයුතු**

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් එක් එක් නිලධාරියා වෙත රු. 25,000ක අඩු පොළී ණය පහසුකමක් ලබාදෙන ලදී.

- **වැඩසටහන්**

කාර්ය මණ්ඩලය අතර මුද්‍රිත ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා ටී-ෂර්ට් නොමිලයේ බෙදාදෙන ලදී.

විදේශ පුහුණු/ වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්භාෂණ සඳහා සහභාගිත්වය

කොවිඩ් - 19 වසංගතය හේතුකොට කිසිදු වැඩසටහනක් නොපවත්වන ලදී.

මූල්‍ය ප්‍රකාශනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
2020 දෙසැම්බර් මස 31වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	සටහන්	2020	2019
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	2,203,844	2,365,493
ඉන්වෙන්ට්‍රි/ තොග	2	81,905	93,110
පූර්ව ගෙවීම්	3	19,009	128,513
සේවක ණය - කෙටිකාලීන	4	223,195	225,792
		2,527,953	**2,812,908**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	5	1,690,478	5,087,612
ආපසු ලැබිය යුතු තැන්පතු	6	75,500	260,670
සේවක ණය - දිගුකාලීන	7	264,948	425,511
		2,030,926	**5,773,793**
මුළු වත්කම්		**4,558,879**	**8,586,701**
වගකීම්			
ජංගම වගකීම්			
උපචිත වියදම්	8	7,330,862	5,508,452
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම්	9	783,915	1,444,461
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	10	4,002,944	3,489,111
		4,786,859	**4,933,572**
මුළු වගකීම්		**12,117,721**	**10,442,024**
මුළු ශුද්ධ වත්කම්		**(7,558,842)**	**(1,855,323)**
ශුද්ධ වත්කම්/ හිමිකම්			
සමුච්චිත අරමුදල		1,907,071	1,907,071
ප්‍රත්‍යාගණන අතිරික්තය		3,763,824	6,159,307
සංචිත		(13,229,737)	(9,921,701)
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**(7,558,842)**	**(1,855,323)**

මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වශයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 03 දක්වා ද සටහන් පිටු අංක 07 සිට 12 දක්වා ද ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයන් වගකිව යුතු වේ. මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අනුමත කර පහත අත්සන් තබා ඇත.

(අ/කළේ)	(අ/කළේ)	(අ/කළේ)
සභාපති	වැ.බ. අධ්‍යක්ෂ	පරිපාලන නිලධාරී

(2020 ජන. 16 සිට 2020 දෙසැ. 31 දක්වා)
2021 අප්‍රේල් පළමුවැනි දින පැරිසියේ සිට අත්සන් කරන ලදී.

(අ/කළේ)
කොමිෂන් සභා සාමාජික

රූපය 15: මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
2020 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා වූ
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය
(සියලු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	සටහන්	2020	2019
ආදායම			
පුනරාවර්තන ප්‍රදාන		25,264,065	25,579,500
මූලධන ප්‍රදාන - පර්යේෂණ හා සංවර්ධන		1,096,000	3,160,500
මූලධන ප්‍රදාන - ධාරිතා වර්ධනය		-	430,000
රජයේ ප්‍රදාන ක්‍රම ක්ෂය කිරීම - ක්ෂය		3,056,029	4,317,572
ආදායම	11	101,358	111,538
		29,517,452	**33,599,110**
වියදම			
පුද්ගලික පඩිනඩි	12	13,361,306	14,092,911
ගමන් වියදම්	13	15,531	461,916
සැපයුම් හා භාවිතා කළ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය	14	320,496	675,097
නඩත්තු	15	677,742	1,875,013
ගිවිසුම්ගත සේවා	16	6,663,219	9,655,675
මාරු කිරීම්	17	4,443,935	4,335,387
ධාරිතා වර්ධනය	18	-	439,225
පර්යේෂණ හා සංවර්ධනය	19	2,948,607	2,932,708
රැස්වීම් වියදම්	20	997,519	161,471
ක්ෂය හා ක්‍රමක්ෂය වියදම්	5	3,056,029	4,317,572
මුළු වියදම්		**32,484,384**	**38,946,975**
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/ (ඌනතාවය)		**(2,966,932)**	**(5,347,865)**

මූල්‍ය පිරිවැය		
දේපල, පිරියත හා උපකරණ අලවියෙන් ලද ලාභය	(341,104.00)	-
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය)	**(3,308,036)**	**(5,347,865)**

රූපය 16: මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TEC/B/NASTEC/1/20/23
මෙම අංකය உமது இல. Your No.
දිනය திகதி Date 2021 අගෝස්තු 20 දින

සභාපති
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7හි 65 වගන්තිය අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද ආයතනය විසින් වත්කම්හි ජීව කාලය සාධාරණව ඇස්තමේන්තුගත කර නොතිබූ අතර ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.2,266,336ක් වූ වත්කම් ඉන් ඔබ්බටද භාවිතා කරමින් පැවතීම නිරීක්ෂණය විය. මෙම හේතුව නිසා එම වත්කම් සඳහා ක්ෂය ගණනය කර නොතිබුණු අතර ප්‍රවර්තන වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිෂන් සභාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන

ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාධ්‍ය ප්‍රකාශයන්ගේනි සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීක්ෂා සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හාචිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා භායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණයට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද

අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) මුදල් රෙගුලාසි 133	කොමිෂන් සභාවේ රාජකාරී කටයුතු පරීක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු බවට විධි විධාන සලසා තිබුණත්, කොමිෂන් සභාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.
(ආ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 5(ආ) වගන්තිය	රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපාර විසින් විද්‍යාව හා තාක්ෂණය භාවිතා කිරීම පිළිබඳව, ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචන වාර්තාවක් සකස් කළ යුතු වුවත් 2019 වර්ෂයට අදාල වාර්තාව 2021 ජූලි 15 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති හා අංක PED 12 දරන පොදු ව්‍යාපාර වක්‍රලේඛයේ 7.4.1 ඡේදය	විගණන හා කළමනාකරණ කමිටුව මාස 03 කට වරක් හෝ කැඳවිය යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය තුලදී එක් විගණන කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.
(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2010 දෙසැම්බර් 10 දිනැති අංක 1/2010 දිනැති වක්‍රලේඛයේ (1)(ඊ) වගන්තිය	රාජ්‍ය ව්‍යවසායන්හි හා විශ්ව විද්‍යාල අනධ්‍යන කාර්ය මණ්ඩලයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක් දරන වසර 12 ක කාලයක් සම්පූර්ණ කර ඇති විධායක නිලධාරීන් සඳහා තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා ගැනීමට හැකි බව දක්වා ඇතත්, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරයා විසින් 2011 ජුනි 08 දින තීරු බදු රහිත වාහන බලපත්‍රයක් මත වාහනයක් ආනයනය කර තිබුණි. කෙසේ වුවද, ඔහුගේ පත්වීම් දිනය 2003 ජූලි 31 වූ අතර, තීරු බදු රහිත වාහනය ආනයනය කරන දිනට ඔහුගේ සේවා කාලය වසර 8 ක් පමණ වී තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර විනය ක්‍රියාමාර්ග ගැනීමට හෝ රජයට වූ පාඩුව වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

NASTEC/09/Audit

2021.10.21

විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
අංක306 / 72
පොල්දූවපාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 31 සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.

ඔබ විසින් එවන ලද 2021අගෝස්තු 20 දිනැති TEC/B/NASTEC/1/20/23 දරණ ඉහත වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත දැක්වේ.

.22.2

(අ) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක කටයුතු ,අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක කාර්ය මණ්ඩලය මගින් කළමනාකරණය කර ගැනීමට අංක:MTR/2/14/NASTEC/Car/Vol II දරණ2020 ..0811 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත. ඒ අනුව ඉදිරියේදී ආයතනයේ සේවක කාර්ය මණ්ඩලය වැඩි කිරීමට තීරණය කර ඇති අතර අභ්‍යන්තර විගණක තනතුරද ඇතුලත් කිරීමට බලපොරොත්තු වේ .

2020 (ආ) වර්ෂයේ පැවති COVID වසංගත තත්ත්වය හේතුකොට ගෙන අපේක්ෂිත ආකාරයෙන් වර්ෂයේ 2019 තොරතුරු එක්රැස් කිරීමට ප්‍රමාද විය. එම හේතුවෙන් 2021 වර්ෂ වල දත්ත එකවර එක්රැස්කිරීම 2020 සහ 2019 වර්ෂයේ සිදු කරමින් පවතින අතර එම වාර්තාව ඉදිරියේදී සම්පූර්ණ කිරීමට කටයුතු සුදානම් කර ඇත .

(ඇ)2020 වර්ෂයට අදාල විගණන කමිටු රැස්වීම් ප්‍රථම සහ දෙවැනි කාර්තු වලදී රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත රජයේ සෞඛ්‍යය නීතිරීති සහ උපදෙස් පදනම් කොටගෙන නොපැවැත්වුණි නමුත් තුන්වන . කාර්තුවට අදාල රැස්වීම2020 ජූලි 28 දින පැවැත්වුණි .අවසන් කාර්තුවට අදාල රැස්වීම දෙසැම්බර් මසට සැලසුම් කලද නැවත කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය .

(ඈ)මේ සම්බන්ධව සොයා බැලීම සඳහා මූලික විමර්ශනයක් පැවති අතර එහි නිර්දේශ සලකා බලා අදාළ නිලධාරියා වන දින 01 ජූලි මස 2020වැටුප් රහිතව වැඩ තහනම් කල අතර චෝදනා පත්‍රයක් ද ලබා දෙන ලදී . මූලික විමර්ශනයෙන් පසුව විධිමත් විනය පරීක්ෂණයක් දැනට සිදුකෙරෙමින් පවතින අතර එය අවසන් වීමෙන් පසු ඉදිරි කටයුතු කිරීමට පියවර ගැනීම සිදු කරනු ලබයි.

නසීමා අහමඩ්
වැ.බ . අධ්‍යක්ෂ

සභාපති වෙනුවට